**සබරගමුව පළාත් සභාව - 2020 වර්ෂය**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

සබරගමුව පළාත් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2021 නොවැම්බර් 16 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 22 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2 ) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර සබරගමුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ---------------------------------- | ------------ |
| (අ) | ආදායම් සංකේත 5 කට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබියයුතු ආදායම් එකතුව රු.68,145,975 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ලැබිය යුතු ආදායම් හඳුනා ගැනීමේ දී සිදුව ඇති ප්‍රමාද දෝෂයකි. 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී ගැලපීම් කිරීමට සටහන් කර ගතිමි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වරද නිවැරදි කළ යුතු ය. |
| (ආ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ 2020 දෙසැම්බර් 31 දිනට යන්ත්‍රෝපකරණ වටිනාකම රු.40,525,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අඩු වූ යන්ත්‍රෝපකරණ වටිනාකම ඇතුළත් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලද සමස්ත වටිනාකම වූ රු.2,133,500,000 හා මූලධන වියදම් (පළාත් ආයෝජන වියදම්) ලෙස දරන ලද රු.993,635,356 ක සමස්ත වියදම මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට ගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රාග්ධනිත කරන ලද රු.720,484,435 ක් වූ ස්ථාවර වත්කම් වටිනාකම ද ඒ තුළට ඇතුළත් වී තිබුණි. | සාමාන්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ සියලු ප්‍රදාන දක්වා ඇති අතර, ස්ථාවර වත්කම් මිල දී ගැනීම ක්‍රියාවලියක් බැවින් කාර්ය සාධනයේ කොටසක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කර ඇත. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරිත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 804 - ප්‍රධාන ලේකම්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ආදායම් ගිණුම අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති හිඟ ආදායම රු.75,685,652 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුළ දී එම හිඟ ආදායමෙන් රු.14,058,895 ක් එනම් සියයට 19 ක් පමණක් රැස්කර තිබුණි. | වසංගත රෝග තත්ත්වය හේතුවෙන් හිඟ ආදායම් අයකර ගැනීමේ ක්‍රියාවලිය විධිමත්ව ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | හිඟ ආදායම් අයකර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | ඉඩම් කොමසාරිස්ගේ 1996 අගෝස්තු 01 දිනැති අංක 96/5 දරන චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික ඉඩම් බදු මුදල් යම් වර්ෂයක ජනවාරි 01 දින හෝ ඊට පෙර අයවිය යුතු වුවත් රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.35,430,569ක් වූ වාර්ෂික බදු මුදල් සහ රු.8,270,056 ක් වූ දඩ මුදල් | ගෙවීම් පැහැර ඇති පුද්ගලයන් හා ආයතනවලින් බදු අයකර ගැනීමටත් බදු ගෙවීම් තවදුරටත් පැහැර හරින්නේ නම් ඉඩමේ සන්තකය ආපසු ලබා ගැනීමටත් පියවර ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර හිඟ බදු මුදල් අයකරගත යුතු ය. |

| | | |
|---|---|---|
| යාවත්කාලීනව අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර එම චක්‍රලේඛයේ 7 (1) ඡේදය ප්‍රකාරව බදු ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවල ඉඩමේ සන්තකය ආපසු ගැනීමට පියවර ගෙන නොතිබුණි. එසේ ම, උක්ත චක්‍රලේඛයේ 6.11 ඡේදය ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක හා කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.7,159,607 ක් වූ හිඟ දීර්ඝකාලීන බදු මුදල් සහ දඩ මුදල් යාවත්කාලීනව අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |

**1.5.2 ශීර්ෂය 808- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සබරගමුව පළාත් සභාව සඳහා පල්දෝරු පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තයේ තාක්ෂණික ඇගයිම් කමිටුවේ සාමාජිකයන් පත් කිරිමේ දී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4(ඇ) සහ (ඈ) මාර්ගෝපදේශයන්ට පටහැනි ලෙස පාරිසරික විශේෂඥයකු හා ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බාහිර නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | වෘත්තීමය ඉංජිනේරුවන්හට පාරිසරික අවශ්‍යතා ගැන අවබෝධයක් ඇති අතර භාහිර සාමාජිකයෙකු වශයෙන් රත්නපුර විධායක ඉංජිනේරු පත්කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය නිවරදිව අනුගමනය කළ යුතු ය. |
| (ආ) | ඉංජිනේරු (සිවිල්) II / III ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක් ද කාර්මික නිලධාරි විශේෂ සේවයේ තනතුරු 01 ක්, සැලසුම් ශිල්පී විශේෂ ශ්‍රේණියේ තනතුරු 04ක් ඇතුළත් තෘතීයික මට්ටමේ පුරප්පාඩු 09 ක් සහ, කාර්මික නිලධාරි (I/II/III) පුරප්පාඩු 48 ක් ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයේ පුරප්පාඩු 97 ක් පැවතුණි. | පුරප්පාඩු සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැන්වීමට කටයුතු කර ඇත. | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.3 ශීර්ෂය 809- පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 09 වැනි උප ලේඛනයේ පළමු වන ලැයිස්තුවේ 36.12 යටතේ පළාත් සභාවට පැවරුණු සහ 1995 පෙබරවාරි 20 දින අනුමැතිය ලද, සබරගමුව පළාත් සභාවේ 1994 අංක 10 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ viii වැනි පරිච්ඡේදයේ 13 වැනි වගන්තිය ප්‍රකාරව වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ අයකරනු ලබන ගාස්තු ලෙස උඩවලව ජාතික වනෝද්‍යානයේ පිවිසුම් ගාස්තු සබරගමුව පළාත් සභාවට අයවිය යුතු වේ. එසේම වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂකගේ අංක වජී/2/11/2 හා 2002 ජුනි 26 දිනැති ලිපිය මඟින් 2001 වර්ෂයේ ඔක්තෝබර් සිට උඩවලව උද්‍යාන ගාස්තුවෙන් වනජීවී සංරක්ෂණ අරමුදලට බැර කරනු ලබන සියයට 50 හැර ඉතිරියෙන් සියයට 40 ක් සබරගමුව පළාත් සභාවට බැර කරන බවත් එම මුදල මහ භාණ්ඩාගාරය මඟින් පළාත් සභාව වෙත ප්‍රේෂණය කරන බවත් දන්වා තිබුණි. එසේ වුවද 2001 ඔක්තෝබර් සිට 2007 නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ රු.24,956,756 ක් සහ 2007 වර්ෂයේ දෙසැම්බර් සිට 2020 දෙසැම්බර් 31 දක්වා අයවිය යුතු මුදල වනජීවී දෙපාර්තමේන්තුවෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් පළාත් සභාව වෙත ලබා දී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර, පළාත් සභාවේ නීති අංශය සමඟ සාකච්ඡා කර අදාළ පියවර ගනිමින් සිටී. | වනෝද්‍යානයේ පිවිසුම් ගාස්තු නිතිපතා සබරගමුව පළාත් සභා අරමුදලට ගෙන්වා ගැනීමටත් 2001 වර්ෂයේ සිට හිඟව පවතින මුදල් ලබා ගැනීමටත් ක්‍රියා කළ යුතුය. |

**1.5.4 ශීර්ෂය 810- නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුභ සාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් අත් යන්ත්‍ර මඟින් රෙදි නිෂ්පාදනය පුළුල් කිරීමත් ග්‍රාමීය කාන්තාවන්ට රැකියා අවස්ථා උත්පාදනය කරදීමත් අරමුණු කොටගෙන 2017 වර්ෂයේ දී රු.9,219,299 ක් වැයකර කැගල්ල පේෂකර්ම ගොඩනැගිල්ලේ ඉහළ මහළ ඉදිකර සී/ස කැගල්ල පේෂකාර්මිකයින්ගේ සමුපකාර සමිතිය වෙත 2017 දෙසැම්බර් 25 දින භාර දී තිබුණ ද එම ගොඩනැගිල්ල වසර 2 ක් නිෂ්කාර්යව පැවති අතර, එම සමිතිය විසින් 2020 ජනවාරි 01 දින සිට පෞද්ගලික ජාත්‍යන්තර පාසලක් වෙත කුලී පදනම මත ලබා දී තිබුණි. ඒ අනුව, උක්ත වියදමෙන් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. | රෙදි නිෂ්පාදනයට අවශ්‍ය බලවේග යන්ත්‍ර මිල දී ගැනීමට ප්‍රමාණවත් තරම් මූල්‍ය ශක්තියක් සමුපකාර සමිතිය සතුව නොපැවතීම හේතුවෙන් එම කාර්යය ප්‍රමාද වී ඇත. සමුපකාර සංවර්ධන අරමුදලේ ණය මූල්‍ය පහසුකම් යටතේ යන්ත්‍ර මිල දී ගැනීමට සමුපකාර සංවර්ධන කොමසාරිස්ගෙන් ඉල්ලීම් කර ඇත. | i. සී/ස කැගල්ල පේෂකාර්මිකයින්ගේ සමුපකාර සමිතියට මෙය ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමට හේතු විමසා යම් නිලධාරියෙකුගේ අතපසුවීමක් සිදු වී ඇතිනම් එම නිලධාරියා සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතු ය.<br>ii. නොපමාව එම ගොඩනැගිල්ල අමාත්‍යාංශයේ අපේක්ෂිත කාර්යන් සඳහා යොදා ගත යුතු ය. |
| (ආ) | 2020 මැයි 20 දිනැති අංක අවිඅ/178102001 දරන විශේෂ අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව අනුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ මූල්‍ය වංචාවන් / අක්‍රමිකතා ඇතුළු මූල්‍ය විනය පිරිහීයැම හා පරිපාලන ව්‍යුහයේ දුර්වලතා අනාවරණය කර උචිත නිර්දේශයන් ඉදිරිපත් කර තිබුණ ද 2021 මාර්තු දක්වා එම නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ වාර්තාව ලැබුණු පසු එම නිර්දේශ ක්‍රියාත්මක කරමි. | අභ්‍යන්තර විගණන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | සබරගමුව පළාත් සභා සංකීර්ණය සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී රු.32,775,000 ක් වැයකර සූර්ය විදුලි ජනක පද්ධතියක් සපයා සවිකර ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියේ ලංසු ඇගයීමේ දී උපාංග 02 ක් සඳහා වූ පිරිවිතරයන් 15 ක් සම්බන්ධයෙන් ඇගයීම් කර නොතිබුණි. | සියලු පිරිවිතරයන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පරීක්ෂා කර උපකරණ ආනයනය සඳහා අවසර ලබා දෙන අතර, මෙම අයිතම සඳහා එම අනුමැතිය ලැබී තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ලේඛනවල දක්වා ඇති සියලු පිරිවිතරයන් අගය කළ යුතු ය. |

**1.5.4.1 මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෑගල්ල, කරවනැල්ල, යටියන්තොට, බුලත්කොහුපිටිය හා දැරණියගල බස් නැවතුම්පල කඩ කාමර බදු දීමේදී ගිවිසුම්ගතනොවී බදු දී තිබීම, ගිවිසුම්ගත කඩකාමර වලින් අඩු බදු කුලියක් අයකිරීම හා ගිවිසුම් අවලංගු වූ කඩකාමර නැවත කුලියට නොදීම හේතුවෙන් එකතුව රු.3,550,300 ක් අධිකාරියට අහිමි වී තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. | නිරීක්ෂණයෙහි සඳහන් සියලුම අඩුපාඩු නිවැරදි කළ යුතු ය. |

**1.5.4.2 සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජයිකා පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මිල දී ගෙන තිබුණු රු.29,900,000 ක් වූ පෙරමුසු ඇතුරුම් නිෂ්පාදන යන්ත්‍ර දෙකක් 2015 වර්ෂයේ දී අධිකාරිය වෙත ලැබී තිබුණු අතර, එම යන්ත්‍ර භාරගත් දින සිට උපයෝජනය කර නොතිබුණු අතර, 2021 අප්‍රේල් 09 වන විට මෙම යන්ත්‍ර නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් විනාශ වෙමින් පැවතුණි. තවද, මෙම යන්ත්‍රයන්හි ආරක්ෂාව සඳහා යෙදූ මුරකරුවන් තිදෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.699,100 ක වැටුප් ගෙවා තිබුණි. | මෙම යන්ත්‍ර මඟින් අධිකාරියට ඵලදායි ප්‍රයෝජනයක් ගත නොහැකි බවත් මුරකරුවන්හට ගෙවන වැටුප ඵලදායි නොවන බවත් ප්‍රධාන ලේකම්තුමිය හා ගරු ආණ්ඩුකාරතුමා නිරන්තරයෙන් දැනුවත් කරන ලදී. | උපයෝජනයට ගැනීම හෝ එසේ කළ නොහැකි නම් අපහරණය කළ යුතුය. |
| (ආ) | ප්‍රධාන කාර්යාලය මඟින් කෑගල්ල උප කාර්යාලය සතුව තිබිය යුතු ලෙස දක්වන ලද යන්ත්‍රෝපකරණ 02 ක් 2021 ජනවාරි 11 දින භෞතිකව හෝ ලිඛිතව කෑගල්ල උපකාර්යාලයේ පවතින බව විගණනයට තහවුරු කර නොතිබුණි. | ප්ලේට් වෛබ්‍රේටර් යන්ත්‍ර සම්බන්ධයෙන් කමිටුවක් මඟින් සොයා බලා ඉදිරියේ දී වාර්තාවක් ලබා දීමට කටයුතු කරමි. | නොපමාව මු.රෙ.104 ප්‍රකාර පරීක්ෂණයක් සිදුකර නිසි පියවර ගත යුතුය. |

**1.5.5 ශීර්ෂය 811- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය සෞඛ්‍ය සේවාවන්හි වෛද්‍ය සැපයුම් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය සහ සඵලදායීත්වය ඉහළ නැංවීම අරමුණු කරගත් වෛද්‍ය සැපයීම් කළමනාකරණ තොරතුරු පද්ධතියේ මූලික අදියර යටතේ 2019 වර්ෂය අවසන්වන විට වෛද්‍ය සැපයීම් අංශය විසින් සබරගමුව පළාතේ සෞඛ්‍ය ආයතන 33 ක් සඳහා පරිගණක යන්ත්‍ර 118 ක් හා මුද්‍රණ යන්ත්‍ර 37 ක් ලබා දී තිබුණි. එසේ වුවද, සෞඛ්‍ය ආයතන 24ක් සඳහා ලබා දී තිබුණු පරිගණක යන්ත්‍ර 86 ක් සඳහා උක්ත කළමනාකරණ තොරතුරු පද්ධතියට අවශ්‍ය මෘදුකාංග ස්ථාපිත කර නොමැති වීම මත 2021 පෙබරවාරි වන විටත් එම පරිගණක යන්ත්‍ර අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතා කිරීමට නොහැකි වී තිබුණි. | මෙම තොරතුරු පද්ධතියට අදාළව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් පුහුණුවට අදාළ නිලධාරීන් යොමු කිරීම පමණක් සිදු කරනු ලබන අතර, පරිගණක යන්ත්‍ර හා මෘදුකාංග සැපයීම වෛද්‍ය සැපයුම් අංශය විසින් සිදු කරයි. එබැවින් යන්ත්‍ර ලබාදීම, මෘදුකාංග ස්ථාපිත කිරීම හා නිලධාරීන් පුහුණු කිරීම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ පාලනයෙන් බැහැර වූවක් බව පෙන්වා දෙමි. | වෛද්‍ය සැපයීම් අංශය සමඟ සම්බන්ධ වී ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2020 වර්ෂය තුළ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් එකතුව රු.13,451,196 ක පිරිවැයක් දරමින් ආයතන 17 ක පැවති සමාන ආකාරයේ ඉදිකිරීම්/ අලුත්වැඩියා කටයුතු කුඩා කොටස් 95 ක් ලෙස වෙන්ව හඳුනාගෙන සිදුකර තිබුණු බව ආයතන 21 කට අදාළ ඉදිකිරීම්/ අලුත්වැඩියා කටයුතු පරීක්ෂාවේ දි නිරීක්ෂණය විය. එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමකින් තොරව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ හෝ අදාළ ආයතන ප්‍රධානීගේ නිර්දේශය පරිදි තෝරාගත් පුද්ගලයින් ලවා අදාළ කාර්යයන් සිදුකිරීම නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව රජයට ලබා ගැනීමට හැකිව තිබුණු පිරිවැය වාසි අහිමි වී ඇති බවත්,1.2.1 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව සුදුසුකම්ලත්, උනන්දුවක් දක්වන | අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට පෙර ඊට අදාළ ශ්‍රමික දින ඇස්තමේන්තුවකට පළාත් ඉංජිනේරුගේ නිර්දේශය ලබා ගනී. දෛනික පදනමට ශ්‍රමිකයින් ලබා ගැනීම සිදු වේ. නිර්දේශිත දින ගණන ඉක්මවා ගෙවීම් සිදු නොකරන බව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව රජයට උපරිම පිරිවැය වාසි ලබාගත හැකි පරිදි කොන්ත්‍රාත් පිරිනැම්ම සිදුකළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගි වීම සඳහා සමාන හා උපරිම අවස්ථාවක් ලබා දී නොමැති බවත් නිරීක්ෂණය විය. | | |
| (ඇ) | 2019 වර්ෂයේ දී ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු.137,450,000 ක් වැයකර CT Scanner යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබුණු අතර, මෙම යන්ත්‍රවල වගකීම් කාලය තුළ නඩත්තු සහ සියලු සේවා කිරීම් නොමිලේ ඉටු කළයුතු වුවද, එම කාලයත් ඇතුළුව එම යන්ත්‍ර මුදල් ගෙවා සේවා කිරීම සඳහා සැපයුම්කරු සමඟ ගිවිසුම් ගත වී තිබුණි. ඒ අනුව, ඇඹිලිපිටිය රෝහලේ ස්ථාපිත යන්ත්‍රය 2019 වර්ෂය තුළ දී සිදු කරන ලද සේවා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.4,981,500 ක් ගෙවා තිබුණි. තවද, ගිවිසුමේ 4.7.2 වගන්තිය ප්‍රකාරව මෙම යන්ත්‍ර වර්ෂයකට 04 වාරයක් සේවා කළ යුතු වුවද, ගිවිසුම් ගත කාලය තුළ දී වාර 02 ක් පමණක් සේවාකර තිබුණි. 2020 අප්‍රේල් 30 දිනෙන් වගකීම් කාලය අවසන් වී ඇති අතර, ඉන් පසු සේවා කිරීම සඳහා ගිවිසුම් ගත වී නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ දී යන්ත්‍ර 02 හි කිසිදු සේවා කිරීමක් සිදුකර නොතිබුණි. | වගකීම් කාලය තුළ ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | සේවා ගිවිසුම් අලුත් කිරීමටත් වගකීම් කාලය තුළ ගෙවූ මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතු ය. |
| (ඈ) | පළාත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අනුමත කාර්ය මණ්ඩලය එහි තථ්‍ය කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේ දි තනතුරු 20 කට අදාළව ඇතැම් රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල යනාදී ආයතනවල අතිරික්තතා පැවතිය දී තවත් ආයතනවල එම තනතුරුවලට අදාළවම ඌනතා පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම තත්ත්වය පළාත් සෞඛ්‍ය සේවාවේ කාර්ය සාධනයට අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය කෙරේ. | පවතින අනුමත සංඛ්‍යාවන් ඉක්මවා සේවා අවශ්‍යතා පැන නැගී ඇති අතර, ඒ සඳහා අනුමත සංඛ්‍යාවන් වැඩි කර දෙන මෙන් ඉල්ලීම් කර එම අනුමැතියන් ලැබෙනතෙක් නව භෞතික සම්පත් වලින් උපරිම සේවාවක් ලබා ගැනීම සඳහා සේවා අවශ්‍යතාව පවතින ආයතන වෙත අනුමත සංඛ්‍යාව ඉක්මවා අනුයුක්ත කිරීම් සිදු කිරීමට සිදු වී ඇත. | ආයතන අතර කාර්යය මණ්ඩලය තුළනය කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.6 ශීර්ෂය 812- ආයුර්වේද දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික වියළි ඖෂධ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා දේශීය හා ආනයනික වියළි ඖෂධ සඳහා 2018, 2019 හා 2020 වර්ෂයන් හි දී පිළිවෙලින් රු.6,809,885 ක් රු.14,036,825 ක් හා රු.11,172,783 ක් වශයෙන් වැයකර භාහිර සැපයුම්කරුවන්ගෙන් මිල දී ගෙන තිබුණි. එහෙත්, ආයුර්වේද දෙපාර්තමේන්තුවට අදාළ ආයතන 23 ක් පිහිටි ඉඩම්වල ඖෂධ වගා කළ හැකි භූමි ප්‍රමාණය හෙක්ටයාර 09 කට වඩා වැඩිවන අතර, එම භූමිය තුළ ඖෂධ වගා ව්‍යාපෘති ප්‍රචලිත කර ඖෂධ නිෂ්පාදන වර්ධනය කර ගැනීමට දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි. | ඉඩම්වල වගාකිරීම සඳහා කම්කරු ශ්‍රමය හිඟ බැවින් කාර්ය මණ්ඩලය වැඩිකර දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇතත්, මේ දක්වා අනුමැතිය ලැබී නොමැත. ඉදිරියේ දී දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල ඖෂධ වගා කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් යොදා ඇත. | පවතින ඉඩම් උපයෝජනය කොට දේශීයව ඖෂධ වගාව ආරම්භ කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක ඌනතාවයන් 27 ක් සහ අනෙකුත් තනතුරු 21 ක ඌනතාවයන් 189 ක් පැවැතුණු අතර, ඒ තුළ සහකාර/ නියෝජ්‍ය කොමසාරිස්වරයකු, ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 11 ක්, විශේෂඥ ආයුර්වේද වෛද්‍ය නිලධාරී (සාම්ප්‍රදායික) 12 ක්, පරිපාලන නිලධාරී 01 ක්, හෙද නිලධාරී 34 ක්, ඖෂධවේදී 10 ක් හා උපස්ථායක 41 ක් ඇතුළත් විය. තවද, අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා සාමාන්‍ය කම්කරු 15 දෙනෙක් හා සනීපාරක්ෂක කම්කරු 70 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | මෙම තනතුරු සම්පූර්ණ කර දෙන මෙන් මධ්‍යම රජය හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇත. PL-2 කාණ්ඩයේ තනතුරුවල පුරප්පාඩු පිරවීමත් සමඟ මෙම අතිරික්තතා මඟ හැරී යනු ඇත. | පුරප්පාඩු පිරවිය යුතු ය. |

**1.5.7 ශීර්ෂය 813 - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමුපකාර ප්‍රඥප්තියේ 44(i) වගන්තිය ප්‍රකාරව සෑම අවුරුද්දකට වරක්වත් සෑම ලියාපදිංචි සමිතියකම විගණනය කළයුතු වුවත්, ක්‍රියාකාරි සමිති 243 න් 2019 වර්ෂය සඳහා සමිති 128 ක විගණනය සිදුකර නොතිබුණි. ඉන් සමිති 35 ක 2019 වර්ෂයේ විගණනය සඳහා විගණකවරුන් පත්කර නොතිබුණි. එසේම 2019 වර්ෂයට පෙර වර්ෂ වලද විගණනය සිදු නොකරන ලද සමිති 59 ක් පැවති අතර, ඉන් ඇතැම් සමිති 2012 වර්ෂයේ සිට විගණනය සිදුකර නොතිබුණි. | සමිති 59 න්, සමිති කිහිපයක විගණනයන් සිදුකරමින් පවතින අතර, තවත් සමිති කිහිපයක විගණනයන් අවසන් කර වාර්තා ආයතනයට ලැබීමට නියමිතය. එසේ ම තවත් සමිති කිහිපයක විගණනය සඳහා නිලධාරින් පත් කර ඇති අතර, අනෙකුත් සමිති විගණනයන් 2021 වසරේ දී සිදු කිරීමට සැලසුම් කර ඇත. | ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව කාලීනව විගණන කටයුතු කළ යුතුය. |
| (ආ) | සමුපකාර සමිතිවල ආරවුල් විසදීම සඳහා සමිති විසින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත තීරක ගාස්තු වශයෙන් ගෙවනු ලබන මුදලින් ආරවුල් විසදීම සඳහා වන වියදම් දැරීමෙන් පසු ඉතිරිවන මුදල් අදාළ සමිති වෙත ආපසු නොයවා තීරක ගාස්තු බැංකු ගිණුමෙහි රඳවාගෙන තිබුණු අතර, එම ගිණුමේ ශේෂයෙන් වැඩි කොටසක් එම ගාස්තුවලින් සමන්විත වේ. ඒ අනුව තීරක ගාස්තු බැංකු ගිණුමෙහි 2020 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු.23,152,335 ක් වූ අතර, ඊට අමතරව රු.30,898,997 ක් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් නමින් ස්ථාවර තැන්පතු 06 ක ආයෝජනය කර තිබුණි. | ආරවුල් විසදීම සඳහා සමිතිවලින් අයකරනු ලබන මුදලින් ගෙවීම් කළ පසු යම් මුදලක් ඉතිරිවිය හැකි ය. එය නැවත සමිති වලට ලබා දී නොමැති අතර, එම මුදල් තීරක අරමුදල තුළ පවතී. | ඉතිරි මුදල් අදාළ සමිතිවලට ගෙවීමට ක්‍රමවේද සකස් කළ යුතු ය. |

**1.5.8 ශීර්ෂය 814 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 29 න් 13 ක විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොවීමෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ "සෑම පළාත් | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් සහිතව හා රහිතව වුවද පළාත් පාලන ආයතන විසින් මේ වන විට විධිමත් කසල කළමනාකරණ ක්‍රියාවලියක් | කසළ කළමනාකරණය පිළිබඳව දෙපාර්තමේන්තුවේ අරමුණ ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පාලන ආයතනයකම විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීම" යන අරමුණ ඉටුවී නොතිබුණි. | පවත්වාගෙන යනු ලැබේ. | |

**1.5.9 ශීර්ෂය 820 - පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**

------------------------------------------------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------------------ | ----------- |
| (අ) | පින්නවල හෝටල් පාසල සඳහා ගිවිසුම්ගත වටිනාකම රු.125,267,510 ක් වූ සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (අ) ජේදය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සැලසුම් නොකිරීම හේතුවෙන් අවස්ථා 06ක දී කල් දිගු 07 ක් ලබා දී තිබුණි. | ඉදිකිරීම් සිදු කරගෙන යාමේදී වැඩ බිම් පරීක්ෂාවේදී අත්‍යවශ්‍ය වන යම් යම් වෙනස්කම් සිදුකිරීමත් කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට ප්‍රමාදවීමත් හේතුවෙන් මෙම ප්‍රමාදය සිදු වී ඇත. | සැලසුම් සකස් කිරීමේදී අවශ්‍යතාවය පැහැදිලිව හඳුනාගෙන ඒ සඳහා අදාළ අංශයන්ගේ එකඟතාවය ලබා ගෙන ඉදිකිරීම් අරම්භ කළ යුතුය. |
| (ආ) | උක්ත හෝටල් පාසල ඉදිකිරීමේ භූමියේ තිබුණු සබරගමුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගබඩා කාමරය හා ගරාජය කඩා ඉවත් කර නැවත ඉදිකර තිබුණු අතර මෙම ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව රු.3,298,064 ක වටිනාකමට හෝටල් පාසල ඉදිකරන කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගත වීමට 2016 අගෝස්තු 31 දිනැති පළාත් මාර්ග අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබූ අතර එම ඉදිකිරීම් වෙනුවෙන් රු.2,927,585 ක් ගෙවා තිබුණි. | සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක සීඑස්/08 සහ 2016.08.24 දිනැති ලිපිය මගින් උපදෙස් ලබා දී ඇති අතර, අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදන තීරණ ගෙන ව්‍යාපෘතිය තුළ වෙන්ව ඇති අවිනිශ්චිත ප්‍රතිපාදන සීමාව තුළ මෙම ඉදි කිරීම සිදු කර ඇත. | සියලු ඉදිකිරීම් අවශ්‍යතා හඳුනාගෙන මූලික ඇස්තමේන්තු පිළියෙල කර ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතු ය. |

**1.5.10 ශීර්ෂය 830- සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය**

------------------------------------------------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------------------ | ----------- |
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය බලවේග අත්යන්ත්‍ර මිලදී ගැනීමට රු.4,500,000 ක් 2020 වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම තුළ | කාර්යය පැවරීමෙන් පසුවද ඉදිකිරීම් කාර්යය සිදුකිරීම සඳහා අවම වශයෙන් මාස 6ක පමණ කාලයක් ගතවීමත් නිසා ප්‍රමාණවත් කාලයක් නොමැතිවීම හේතුවෙන් කාර්යය | සැලසුම් කළ පරිදි කාර්යය ඉටුකිරීමට වග බලාගත යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | වෙන් කර දී තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අවශ්‍ය බලවේග උපකරණ මිලදී ගැනීමේ කාර්යය ඉටු කර නොතිබුණි. | අතහැර දැමීමට සිදුවිය. | |
| (ආ) | කර්මාන්ත අමාත්‍යාංශය විසින් හොරේපොල හා හිඟුරආර ගම්මානවල ප්‍රතිලාභීන් 25 දෙනෙකු සඳහා වැඩ මඩු සැකසීම සඳහා රු. 1,278,183 ක් වටිනා ද්‍රව්‍යාධාර ලබා දී තිබුණි. 2021 පෙබරවාරි 03 දින වැඩ මඩු භෞතික පරීක්ෂාවේ දී ප්‍රතිලාභීන් 17 දෙනෙකු අතුරින් 10 දෙනෙක් සඳහා ලබා දී තිබුණු රු.555,005 ක් වටිනා ද්‍රව්‍යාධාර උපයෝගී කර වැඩ මඩු සකසා නොතිබුණු අතර ද්‍රව්‍යාධාර ලබා දී වසරක කාලයක් ගතව තිබුණද වැඩ මඩු සකසා එම වැඩ මඩුවේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබුණි. | වැඩමඩු ඉදිනොකළ කර්මාන්ත කරුවන්ට එම මඩු කඩිනමින් ඉදිකරගන්නා ලෙස ජාතික ශිල්ප සභා දිස්ත්‍රික් නිලධාරිද එක්ව දැනුවත් කර ඇති අතර ඔවුන් ඒ සඳහා එකඟ වී ඇත. | ව්‍යාපෘති ක්‍රියාත්මක වන අවස්ථාවේ දී නිසි අධීක්ෂණයක් සිදු කළ යුතුය. |

**1.5.10.1 කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අංක 14 දරන සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ සඳහන් කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අදාළ බලතල හා කාර්යයන් 07 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී මේ පිළිබඳව අවධානය යොමු කර මෙම බලතල හා කාර්යයන් ඉටු කිරීමට එකඟ වෙමි. | බලතල හා කාර්යයන් ඉටුකිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.19,692,264 ක් වූ වෙළඳ ණයගැතියන්ගෙන් එකතුව රු.1,549,130 ක් වූ ණයගැති ශේෂ 18 ක් වසර 05 කට වැඩි කාලයක සිට ද එකතුව රු.565,268 ක් වූ ණයගැති ශේෂ 07 ක් වසර 10 කට වැඩි කාලයක සිට ද හිඟව පැවතුණි. | මේ වන විට ණය අය කර ගැනීම සඳහා ණය ගැතියන්ට එන්තරවාසි ලිපි යවා ඇති අතර සියලුම ණය ගැතියන්ගෙන් ණය මුදල් අය කර ගැනීමටත් ණය නොගෙවන ණයගැතියන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරමි. | හිඟහිටි ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.11 ශීර්ෂය 831 - කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තාක්ෂණ නිලධාරී තනතුරු 03 ක්, උපදේශක තනතුරු 16 ක් සහ මුරකරු තනතුරු 14 ක් ඇතුළුව පුරප්පාඩු 38 ක් පැවති අතර අනුමත කර ගැනීමකින් තොරව වැද්දුම්කරු තනතුර සඳහා එක් සේවකයෙකු බඳවාගෙන තිබුණි. | ඉදිරියේ දී බහුකාර්ය සංවර්ධන වැඩසටහන යටතේ පුරප්පාඩු පිරවීමට දැනුම් දී ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

**1.5.12 ශීර්ෂය 832 - පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සහකාර පරිවාස කොමසාරිස් එක් තනතුරක් ද, පරිවාස නිලධාරීන් සිවුදෙනෙක්ද, ඇතුළු පුරප්පාඩු 22 ක් සම්පූර්ණ කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතී. | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.12.1 සමාජ සේවා අරමුදල**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1994 අංක 04 දරන සබරගමුව පළාත් සභාවේ සමාජ සේවා අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 06 වන රෙගුලාසිය මගින් දක්වා ඇති පරිදි අසරණ හා ආබාධිතව සිටින දරුවන් සඳහා ලබාදිය හැකි පෝෂණ හා අධ්‍යාපන ආධාර ලබා දීමට අරමුදල කටයුතු කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසානයට අරමුදලේ මුදල් ශේෂය රු.77,943,752 ක් විය. | පෝෂණ ආධාර හා අධ්‍යාපනාධාර සඳහා ඉල්ලීම් ලැබී නොමැති අතර, ඒ සඳහා ඉල්ලීම් ලැබේ නම් ඒවා ඉටු කිරීමට කටයුතු කරමි. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**1.5.13 ශීර්ෂය 840- අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෑ/අඹේපුස්ස මහා විද්‍යාලයේ තාක්ෂණික ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2017 ජනවාරි 23 දින පෞද්ගලික සමාගමක් සමඟ රු.20,833,115 ක වැඩ වටිනාකමකට ගිවිසුම්ගතව තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2017 ඔක්තෝබර් 15 දින වැඩ අවසන් කළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වැඩ අවසන් කර නොතිබුණු අතර, රු.1,041,656 ක් වූ කාර්යය සාධන ඇපකරය 2019 ඔක්තෝබර් 18 දින කල් ඉකුත්වී තිබුණි. තවද, රු.6,249,934 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබූ අතර ඉන් රු.4,066,315 ක් පියවා නොතිබුණි. එසේ වුවද, අත්තිකාරම් ඇපකරය ද 2020 මාර්තු 31 දින කල් ඉකුත්ව තිබුණි. | ඉදිරියේ දී නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගනු ලබන බව කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇති අතර, අසාධු ලේඛනගත කිරීමට කටයුතු කරමින් පවතී. | කොන්ත්‍රාත් ප්‍රමාදයන් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළ යුතු ය. |
| (ආ) | බලංගොඩ, ඇඹිලිපිටිය, නිවිතිගල, දෙහිඕවිට, මාවනැල්ල හා කෑගල්ල අධ්‍යාපන කලාපවල එකම පාසලක වසර 15 කට වැඩි කාලයක් සේවය කළ විදුහල්පතිවරු 54 ක් ද, වසර 10 ත් 15 ත් අතර කාල පරාසයක සේවය කළ විදුහල්පතිවරු 86 ක් ද, වසර 08 ත් 10 ත් අතර කාල පරාසයක සේවය කළ විදුහල්පතිවරු 130 ක් ද ස්ථාන මාරු වීම් නොලබා අඛණ්ඩව තවදුරටත් සේවයේ යෙදී සිටිමින් පැවතුණි. | විධිමත් ස්ථානමාරු ප්‍රතිපත්තිය ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර ඇති අතර, එය අනුමත වූ පසු ස්ථාන මාරුවීම් කිරීමට හැකි වේ. | විදුහල්පති සේවයේ ස්ථානමාරුවීම් කාලීනව සිදුකළ යුතු ය. |

**1.5.14 ශීර්ෂය 841 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ළඟම පාසැල හොඳම පාසැල වැඩසටහන යටතේ 2017 වර්ෂයේදී මාවනැල්ල හා නිවිතිගල අධ්‍යාපන කලාපවල පාසල් 03 ක එකතුව රු.4,983,545 ක් වැයකර ඉදිකර තිබුණු වැසිකිළි පද්ධතිය නාය | 2014 වර්ෂයේ සංගණන තොරතුරු පදනම් කරගෙන ඉදිකිරීම් සිදුකර තිබූ අතර, වර්තමානයේ දී නායයාමේ අවධානම හේතුවෙන් පාසල් වැසී යාම මත මෙම තත්ත්වය ඇති වී ඇත. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතු අතර, නඩත්තු කටයුතු අඛණ්ඩව සිදුකළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | යාම් අවදානම සහ නඩත්තු නොවීම යන හේතු මත 2017 සහ 2018 වර්ෂයේ සිට අභාවිතව පැවතුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පළාතේ එක් එක් අධ්‍යාපන කලාප අතර ගුරු ඌනතාවය 3,319 ක් ද, ගුරු අතිරික්තය 1,832 ක් ද වූයෙන් ගුරු සංඛ්‍යාවේ තුලනයක් සිදුකර ගැනීමේ හැකියාව තිබුණද, එසේ සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | කලාප තුළ ගුරු තුලනය සිදුකළ යුතු ය. |
| (ඇ) | දෙහිඕවිට, රත්නපුර සහ ඇඹිලිපිටිය කලාප අධ්‍යාපන කාර්යාල සතු නිල නිවාස 341 කින් භාවිතයට ගත නොහැකි නිල නිවාස 99 ක්ද, පදිංචිය හැර වෙනත් පාසැල් කටයුතු සඳහා යොදාගන්නා නිල නිවාස 18 ක් ද අනවසර පදිංචිකරුවන් සිටින නිල නිවාස 02 ක් ද පැවතුණි. | භාවිතයට ගත නොහැකි නිල නිවාස කඩා ඉවත් කිරීමටත් අලුත්වැඩියා කළ යුතු නිල නිවාස අලුත්වැඩියා කිරීමටත් අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමටත් කටයුතු කර ඇත. | නිල නිවාස නඩත්තු කරමින් ආරක්ෂාකර ගැනීමටත් ඵලදායී ලෙස උපයෝජනයටත් පියවර ගත යුතුය. |
| (ඈ) | සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයේ මූල්‍ය රීති 59 ප්‍රකාරව සාමාන්‍ය පාලන වැඩ සටහන යටතේ සිදු වූ රු.97,080 ක අලාභයක් ද ද්විතීය අධ්‍යාපනය යටතේ පාසල් 17 ක ඇති වූ රු.1,035,156 ක අලාභයක් ද අයකර ගැනීමට සහ පොතෙන් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | කපා හැරීමට කටයුතු කිරීමට දැනුවත් කරමි. එවැනි අතපසුවීම් නොවීමට වග බලා ගනිමි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**1.5.15 ශීර්ෂය 850 - ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය**

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් ඉඩම් අමාත්‍යාංශය යටතේ සබරගමුව පළාත තුළ පවතින කාලීන ජලාශ 33 න් රත්නපුර දිස්ත්‍රික්කයේ පවතින කාලීන ජලාශ 5 කට ආදාළව සිදුකළ නියැදි පරීක්ෂාවේදී දීර්ඝ කාලීනව රොන් මඩ ඉවත් කිරීම සිදු නොකිරීම නිසා කාලීන ජලාශ වල ජල | රත්නපුර දිස්ත්‍රික්කයේ බොහෝ කාලීන ජලාශවල අයිතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව පවතින බැවින් රොන් මඩ ඉවත් කිරීම පිළිබඳ එම ආයතන සතුව යම් වැඩපිළිවෙලක් පවතී ද යන්න විමසා | මිරිදිය ධීවර කර්මාන්තය නගාසිටුවීම සඳහා පළාත තුළ පවතින ජලාශයන් පිළිබඳ තොරතුරු රැස්කර එම ජලාශයන් නඩත්තු කිරීම සඳහා සුදුසු සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ධාරිතාවය අඩු වීමට ලක්ව ඇති බැවින් මත්ස්‍ය අස්වැන්න වැඩි කර ගැනීමට එම ජලාශ පිරිසිදු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කළ යුතු බව නිරීක්ෂණය විය. එසේම රොන් මඩ ඉවත්කර නඩත්තු කර නොතිබීමෙන් එම ජලාශයන්හි සම්පූර්ණ ධාරිතාවයම වර්තමානයේ භාවිතයට ගැනීමට නොහැකි තත්ත්වයක් පැවතුණි. | බලා එසේ නොමැතිනම් අමාත්‍යාංශය මගින් සැලසුමක් සකස් කර ඒ සඳහා ප්‍රතිපාදන මුදල් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටීමට බලාපොරොත්තු වෙමි. | |

**1.5.16 ශීර්ෂය 851- ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුකුළේගම උතුර හා තපස්සරකන්ද ග්‍රාම නිලධාරි වසම්වල පිළිවෙලින් රූඩ් 03 ක් හා අක්කරයක් විශාල වූ රජයේ ඉඩම් 02 ක් වාර්ෂික අවසර පත්‍රයක් මඟින් හා ජයභූමි ඔප්පුවක් මඟින් පෞද්ගලික පාර්ශවයන් වෙත ලබා දී තිබුණු අතර, එම පාර්ශවයන් විසින් ඉඩම්වලින් පිළිවෙලින් පර්චර්ස් 15 ක් හා 20 ක් වූ බිම් කොටසක් පෞද්ගලික ආයතනයක සම්ප්‍රේෂණ කුලුනු ඉදිරිකිරීමට වර්ෂ 10 කට බදු දී තිබුණි. මේ සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්ගේ 2012 සැප්තැම්බර් 27 දිනැති අංක පීඑල්සී 10 දරන ලිපිය මඟින් කලවාන ප්‍රාදේශිය ලේකම්ට දිමනා පත්‍ර රජයට භාර ගැනීමටත් සම්ප්‍රේෂණ කුලුනු ඉදිරිකිරීමට අදාළ ඉඩම් කොටස් දිගුකාලීන බලපත්‍ර මත එම සමාගම් වලටම ලබාදීමට යෝජනා ඉදිරිපත් කරන ලෙසටත් දන්වා තිබුණද එපරිද්දෙන් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය සහ ගෙන ඇති ක්‍රියාමාර්ග වාර්තාකරන ලෙස ප්‍රාදේශිය ලේකම් කලවාන වෙත දැනුම් දී ඇත. | ප්‍රාදේශීය ලේකම් ලවා ඉඩම් කොමසාරිස්ගේ නියෝග ක්‍රියාත්මක කරවිය යුතු ය. |
| (ආ) | නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහ කලවාන ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් වල පෞද්ගලික සමාගමක් විසින් ඉදිකර තිබුණු කොස්වතු ගඟ කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියට අදාළව නිවිතිගල ප්‍රාදේශීය ලේකම් විසින් 2017 අප්‍රේල් සිට 2021 අප්‍රේල් දක්වා | හිඟ මුදල් ගෙවීම සම්බන්ධයෙන් අදාළ ආයතනය දැනුවත් කර ඇති අතර ඉදිරියේ දී එම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | ජල බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාලපරිච්ඡේදය වෙනුවෙන් අයවිය යුතු ජල බදු රු.1,500,000 ක් අයකර නොතිබුණි. | | |
| (ඇ) | නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 03 ක ඉඩම් කොටස් 05 ක දීර්ඝ කාලීන බදුදීමට පළාත් ඉඩම් කොමසාරිස්ගෙන් අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද අනුමැතිය ලැබී විගණිත දිනට වසර 01 ත් වසර 05 ත් අතර කාලපරිච්ඡේදයක් දක්වා එම ඉඩම් සඳහා දීර්ඝ කාලීන බදුකර ලබාදී නියමිත බදු මුදල් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | එක් අයෙකුගෙන් නියමිත මුදල් අයකර ඉඩමේ භුක්තිය ලබා දී ඇති අතර අනෙක් අය වෙත බදු මුදල් ගෙවීමට දැනුම් දී ඇත. | ඉඩම් සඳහා දීර්ඝ කාලීන බදුකර ලබාදී නියමිත බදු මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.17 ශීර්ෂය 852 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කරපිංච ග්‍රාමයේ පිහිටි රත්නපුර දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානයට අයත් ද්විත්ව කම්කරු නිල නිවාස 02 ක් වසර 10 කට පෙර සිට අනවසර පදිංචිකරුවන් අත්පත් කරගෙන තිබුණි. | කඩිනමින් අනවසර පදිංචිකරුවන්ට විරුද්ධව නඩු පැවරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු ය. |

**1.5.18 ශීර්ෂය 853- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර ද ඇතුළුව පුරප්පාඩු 49 ක් පිරවීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කරන ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා යවා ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |